


නිර්මාණ අඩවිය

ඉඳ හිට දවසක
www.ketapathpawra.com
අඩවියට ගොඩවන්න

## ඉසිදාසි

රුවට නොඇලුනි
ගුණට නොඇලුනි
දාසියක් වී මෙහෙ කළෙමි
ඉසිදාසිගෙන් පිරිහුණේ කිමදැයි
කියන් හිමිසඳිනේ

හිමිට සැළකීමි
නැදිට සැලකීමි
දාසියක් වී මෙහෙ කලෙමි
කැවිලි උවටැන් පිදිමි ධනයෙන්
ඇල්ම නැත ලැබුනේ

එකෙක් හිමි මා නොපැතුවා
තව එකකු මසකින් නික්මුණා
රුවෙන් අගතැන් වස්තුවෙන් බෑ
සියළු හිමියන් හැර ගියා

ඒත් බුදු හිමිගේ දෙපාමුළ
ඉසිදාසි සස්වාමිකයි
කෙළෙස් මල නිවුණා
ඇවැසි හිමි ලැබුණා

වික්‍රම්ප්‍රිය පෙරේරා



## දුකට කියන කවි

අහස හිර කරයි මා වට දැත දිගු කරන්
වලාකුළු දුවයි කැරකී බලාවී හොරෙන්
ඉරට දැවී දැවී තරු කැට මැලවිලා ගිහින්
සතුට නෑ හිතේ සිතුවිලි බරවෙලා දුකින්

ලෝක දෙක අපේ දෙතැනක සාගරේ මැදින්
හීනයක් නොවේ නුඹ අද ඈත බොහෝ දුරින්
සෙනේ බරට දුක පොදිබැඳ හිතේ තද කරන්
ඉන්න වෙයි කියා හිතුවද හිතේ ගින්දරෙන්

වෙන් වෙලා ගියේ තනිකර මගේ ආදරේ
කවුරුද අපව ලංකරේ දැන දැන දුක් කතන්දරේ
සෝ සුසුම් සැරේ නෙත් විල කඳුලකින් පිරේ
නුඹ පමණි සොඳුර දන්නේ හද තවන මන්තරේ

ශ්‍රියා කුමාරසිංහ
නවසීලන්තය

## සකලබුජං

වයස හතේ අටේ පටං
කොට කලිසම ඉනේ බැදං
අපේ ගෙදර බැල මෙහෙවර
කරපු කොලු සකලබුජං

අම්මෙක් නැති සකලබුජං
අප්පෙක් නැති සකලබුජං
මම පාසැල් ගොස් එනතුරු
ගෙදර හිටිය සකලබුජං

අම්ම කියයි පොල් ගාපං
අක්ක කියයි අතු ගාපං
දිය ඇදපං දර පලපං
හැම දේටම සකලබුජං

නිදි මැරුවා සකලබුජං
ටොකු කෑවා සකලබුජං
ළමා දිවිය බැල මෙහෙයට
දිය කෙරුවා සකලබුජං

තිස් වසකට පෙර දිනයක
අපේ අතින් වුන වරදට
සකලබුජං
අනේ මචං
සමාවෙයං

රසික සූරියආරච්චි

## වෙනස



වදන් දහසකින් වත්
නොහැකිවිය
වටහා දෙන්නට ඇයට
ආදරයේ මිහිරි බව

එකදු වදනක් වත් නොදොඩා
වටහා දුන්නෙහිය
ඇය මට
ආදරයේ කටුක බව

රනුක චන්ද්‍රසූරිය



## බලවතා කවුද...?

මුහුදු රළ කඳ පසු බලා ගොස්
රඳා ගිය පොඩි ලදරු මලකඳ
ඔසව ගත් මව සොලවා බැලූයේ
නැවත දෙන්නට දිවිය ඔහු ලද
සුනාමිය ගිය වසර අගදී
ගෙනා ව්‍යසනය දුටු දනන් හද
කකියවූ දස් පුවත් අතරින්
එකක් විය නෙත රැඳි කඳුළු බිඳ

වසර ගණනක ඉහත දිනයක
සිසිල් රැය මැද බැබලුනා සඳ
ගමක් වටකොට කපා කෙටුවා
විමුක්තියෙ කොටි රැලක් වල් වැද
අසරණව නිදි පැදුරෙ මත සිටි
බිලිඳු දරුවන් කකුල් කෙටි ඇද
ගසා ගස්වල මොලය බැලුවේ
විමුක්තිය එහි ඇතැයි සිතලද

පෙන්නුවේ නැත එවන් පුවතක්
ලෝක ජනමැදි රූපවාහිනී
රූප ගත කොට පෙන්වලා ඇත
සෙබලු කල හදි ලෙසට පටහැනි
ලොවම රවටා බොරුව පතුරා
විමුක්තිය කෙලෙසනා රකුස්සනි
සුනාමිය මොහොතකින් කල දේ
කවුද බලවත් බව කියාදුනි

ප්‍රේමසිරි ගුණතිලක
රෝස්හිල් සිඩ්නි

## පියාණනි

වල් බිහිව ගිය ලඳු කැළෑ දෙනිපෙතේ
තනිකමට තනි රකින්නැයි තනිකමම කෙඳිරුවේ
හිරු අවරගිර අසල ඉකි ගසා වැලපුනේ
ඔබෙ සෙනෙහෙ ගඟ සුසුම් තුළ සැඟවුනේ

බෝසත් ගුණ පිරුණු කරුනාබර හදවතේ
ජීවිතය පුරා විඳි නේක දුක් සැඟවුණේ
අපේ හසරැල්ලකට මුවා වී පෙරදිනේ
හැඬුවාද ඔබ, අපට නොදැනෙන ලෙසේ

රස මසවුළු පුරවගෙන ඔබ පැමිණි ගුරු පාරේ
යලිත් ඔබ එනතුරා වෙනෙත් පෙරමඟ බැලුවෙ
කිසි දිනෙක ඔබ නොඑන බව පිළිනොගන්නා සිතේ
මතකය වේදනාවක් වී නිරතුරුව රිදුම් දේ

ඔබ ලියූ කවි පද අතරේ ඇවිද
මගේ කවි සිත මම ඔප දැමූවද
ඔබට නිම කරනු බැරිවූ ජීවිතේ කවි පොතට
මා කෙලස නම් පසුවදන ලියන්නද

නිමාවන්නට පෙර මේ සංසාරේ
යලිත් විඳගන්නට ඔබේ පිය සෙනෙහේ
ඒවි නම් ඔබ සිනා සී පෙරසේ
හිත හදා රැන්නට එයම පමණක් සෑහේ

චාන්දනී කුලතුංග
නවසීලන්තය

## සුදු පරෙවියා
සනත් පියසේන

අතේ මිරිකෙමින් සිටි
සුදු පාට පරෙවියා
පියාඹා ගිහිල්ලා
එහා වත්තේ කෙනකූ
මෙහා වත්තට හොරෙන්
කැන්දගෙන ඇවිල්ලා

ලේ කඳුළු දකින්නට
නොනිමි ආසාවකින්
ගල් මුගුරු කඩු කිනිසි
ගැටුමකට අර අඳින
මහා මුසල මෙහොත
වතු දෙකේ මායිමේ

සුදු පාට පරෙවියා
වහලෙ යට ලීය මත
පරෙවි ධෙනුව සමග
සාමයේ මුනු මුනුව

## දියසේන
සමන්ත ඉලේපෙරුම

දෙදහස් පන්සිය වසරක් ගෙවිලා අඩ
සිය වසකුත් පමා වුණා..එනවයි කී
නුඹ තවමත් නෑ නොවැ කොහේ
ඉන්නවද දියසේන...

හතලිස් අටේදී
පනස් හයේදී
හැට හැටපහ වලදී ..
ආවේ නුඹ නොව අපියි රෑ වටුනේ නුඹේ
නමින් ආ උන්හට දියසේන..
දෙවි බඹු රැස්වී ඇරයුම් නොකළද
දැනුයි කාළය මෙයයි දේශය උපදිනවා
නම් පමා නොවී..
ලොව ගැන දැනිලා ධර්මය පෙනිලා
මේ කප ගෙවිලා යන්නට පළමුව
උපදිනවා නම් දියසේන....

Disney Maintenance
DM
INDUSTRIAL
COMMERCIAL
DOMESTIC
CARPET STEAM CLEANING - HARD FLOOR CLEANING & SEALING
Disney Maintenance
Rohan Tel: 03 9792 0656 Mob: 0408 106 022